# නිපුණගෙ කතාව



W.M. සනුති සයුම්නා

**කෘතියේ නම - නිපුනගේ කතාව**

**කතෘගේ නම - W.M.**සනුති සයුමිතා

කෘතිය පල කරන දිනය - 2023.12.24

ISBN අංකය - 978-624-208-054-3

**පිදුම**

**පළමු ශ්‍රේණියේ සිට මේ දක්වා**

**සිප් කිරි පෙවූ**

**සියලුම ගුරු මෑණිවරුන් හට**

**ඉතා ආදර භක්තියෙන් යුතුව**

**පුද කර සිටිමි**

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

පටුන


1. පාසල් යාමට ප්‍රමාද වීම
2. ප්‍රශ්න වලින් නිදහස් වීම
3. ගුරුතුමිය පංතියට පැමිණීම
4. නිවාඩු කාලය ආරම්භ වීම
5. යහලුවන් ගේ නිවෙස් වලට යෑම
6. මිතුරන් නිවසට පැමිණීම
7. වැසි දවස්
8. වැස්ස අඩු වීම
9. නිවාඩු කාලය අවසන් වීම
10. පාසල් යෑම

**<u>පාසල් යාමට ප්‍රමාද වීම</u>**

නිපුන වෙනදා ලෙස ම උදෑසන අසිරිය විඳිමින් සිටියේ ය.ඔහු සිතුවේ අද සෙනසුරාදා දිනයක් කියලයි.නමුත් ඔහුගේ නංගි අඬනු ඇසුණු නිසා, ඔහු අද සිකුරාදා දිනයක් කියා දැනගත්තේ ය. ඔහු එසේ සිතූ සැණින්ම ඔහුගේ මව ඔහුට කතා කළා ය."පුතා ඉක්මනට ලෑස්ති වෙන්න අද ඉස්කෝලේ යන්නේ නැද්ද?" "හරි අම්මා, මම අද ඉස්කෝලේ යනවා ."ඔහු එසේ පවසා කඩිමුඩියේ සූදානම් විය.. නිපුන සූදානම් වූ සැනින්  ම කෑම කාමරයට ගියේ ය . නිපුන සමග මව ආහාර ගත් හ.දැනටමත් පාසල් පාසල් බස් රිය පැමිණ ඇතැයි බියෙන් සහ සැකයෙන්  නිපුන පාරට ගියේ ය .  ඔහුගේ සැකය තහවුරු කරමින් බස් රිය පැමිණ තිබුණේ  ය. ඔහු පැමිණෙන තෙක් බස් රියට ප්‍රමාද වීමට සිදුවීම පිළිබඳව ඔහුගේ සිතට දැඩි කණස්සල්ලක් ඇති විය. බස් රියට නැග අසුන් ගත් ඔහු අද සිදුවූ ප්‍රමාදය ගැන සිතමින් පාසල වෙත ගියේය .








**<u>ප්‍රශ්න වලින් නිදහස් වීම</u>**

ඔහු නිසා බසයේ අනික් සිසුන් ටත් පාසල් යාමට ප්‍රමාද වී ඇත්දැයි මෙන්ම ඔහුට ද ගුරුතුමියගෙන් බැනුම් ඇසීමට සිදු වේදැයි ආදී ප්‍රශ්න කීපයක් ම ඔහුගේ හිස තුල දැන් ක්‍රියාත්මක වෙයි.එසේම එවැනි ප්‍රශ්න අනික් සිසුන්ට ත් ඇතැයි ඔහු සිතුවේය. ඔවුන් පාසල අසලින් බැස පාර පැන පාසලට ඇතුල් වූහ .පාසල තුලට පැමිණි නිපුන පාසලේ ඔරලෝසුව දෙස බැලුවේ ය. පාසලේ ඔරලෝසුව සෑම විටම නිවැරදි වෙලාව පෙන්වයි."ෂා ඉස්කෝලේ පටන් ගන්න තව වෙලාව තියෙනවා " ඔහු කීවේය .කලින් තිබූ ප්‍රශ්න වලින් දැන් ඔහු නිදගස් ය. ඔහු හිතේ සතුටින් පන්තිය වෙත පියමං කලේය.




<u>ගුරුතුමිය පංතියට පැමිණීම</u>

දැන් ඔහු සියලු ප්‍රශ්න වලින් නිදහස් ය.සෙමෙන් පන්තියට ගිය ඔහුගේ ගමන ඉක්මන් වූයේ ගුරුතුමිය පන්තියට එනු දැකීමෙනි.කාරයෙන් බැස ගුරුතුමිය ගියේ කාර්‍යාලයටය.නිපුන පන්තියට ගොස් බෑගය බිම තබා ගුරුතුමිය දුන් ගෙදර වැඩ සම්පූර්ණ කිරීමට පටන් ගත්තේ ය. එදින ගුරුතුමිය අඩුවෙන් ගෙදර වැඩ දුන් නිසා ඔහුට එම වැඩ සම්පූර්ණ කිරීමට හැකි විය .සීනුව නාද වීමට පෙර පන්ති කාමරයෙන් පිටත ට ගොස් සිටි ළමයි නැවතත් පන්තියට ගොඩ වූහ .ඔවුන්ට පසුව ගුරුතුමිය ද පන්තියට ඇතුල් විය .එවිට  ම සීනුව නාද විය. මල් පහන් පූජා කොට අපි සැවොම හොදින් ආගමික වතාවත් වල නිරත වුනෙමු.ඉන් පසු අපි සුපුරුදු පරිදි පන්තියේ වැඩ ආරම්භ කලෙමු.



**නිවාඩු කාලය ආරම්භ වීම**

වෙනදා මෙන් නොව හෙට දින සිට දවස් විස්සක පමන දිග නිවාඩු වක් ඇත.නිපුනට සහ ඔහුගේ යහලුවන් වන මනුක,ලසිත්,මේනුකට ද කිරීමට බොහෝ වැඩ ඇත.ඔවුන් තිදෙනා නිපුනගේ හොඳ ම යහලුවන්ය. මෙදින නිපුන නිවසට ගියේ ඉතා සතුටිනි. ඔහු ඔහුගේ පවුලේ අය සමග රාත්‍රි ආහාරය ගෙන කලින්ම නින්දට ගියේය .

**යහලුවන්ගේ නිවෙස් වලට යෑම**

නිපුන උදෙන්ම අවදි වී ජනේල ය අසලට ගියේය.හිරු පැහැදිලිව දකින්නට තිබුනි.මුලු පරිසරය ම හිරුරැසින් නැහැවී තිබුනි.මද වේලාවක් පිටත බලා සිටි නිපුන, නාන කාමරයට ගොස් ඇග සෝදා ගෙන උදෑසන ආහාරය ගත්තේ ය.ඉන්පසු නිවසින් පිටත් වූ නිපුන පලමුව මනුකගේ නිවසට ගියේය .මනුක සමග මද වේලාවක් කතා කරමින් සිටි ඔහු මනුකත් සමගම මේනුකගේ නිවසට ගියේය . ඔහුගේ නිවසේද මද වේලාවක් ගත කල ඔවුහු මේනුක ද කැටුව ලසිත් ගේ ගෙදරට ගියහ.මිතුරන් සියලුම දෙනා ඉතා සතුටින් සෙල්ලම් කිරීමෙන් පසුව ඔවුහු සවස් වීමට ප්‍රථමව නිවෙස් බලා ගියහ. තම මිතුරන්ට තම නිවසට ආරාධනා කිරීමට නිපුන අමතක නොකලේය.







**<u>මිතුරන් නිවසට පැමිනීම</u>**

මව මිතුරන්ට රසවත් ආහාර පිලියෙල කරන අතරේ නිපුන නංගී සමග සෙල්කම් කරමින් සිටියේය .දොරට තට්ටු ජරන හඬක් ඇසුනි. ඒ දෙසර දිව ගිය ඔහු දුටුවේ දොර ලග සිටින ත්ම යහලුවන් ය.ඉහු සිනාසී ඉතා සතුටින් ඔවුන්ව පිලිගත්තේය.ඉහු ඔවුන්ට තම නැගනිය හදුන්වා දුන්නේය.ඉන් පසු ඔවුහු අම්මා විසින් පිලියෙල කර තිබූ අහාර ගෙන විවිධ සෙල්ලම් කලහ.රෑ බෝ වීගෙන ආ බැවින් යහලුවන් නැවත ත් නිවෙස් බලා ගියහ.එවිට ඔහුගේ සිතට  මහත් වූ පාලුවක් දැනින.



**<u>වැසි දවස්</u>**

හිම්දිරි උදයේම මොර සූරන වැස්සක් ඇද හැලුනේය.මුලු දවසේම එක දිගටම වැස්ස පැවති හෙයින් නිපුන නිවසට වී ගුරුතුමිය දුන් වැඩ නිම කලේය.නංගී දවසේ වැඩි වේලාවක් නිදාගත් හෙයින් නිපුනට මහත් පාලුවක් දැනුනේය.එම නිසා එදින ඔහු වැඩි හරියක් කාලය ගෙවා දැමුවේ පොත් සමගය.එකම පොත දෙතුන් වතාවක් කියවීමට ඔහුට සිදු විය. දැන් ඔහුට කියවීමට ඇති පොත් අවසන් වී ඇත.අම්මා මුලු දවසේම වැඩෙහි යෙදෙයි.තාත්තා ද නිවසේ නැත.එක දිගටම පැවති වැස්සත් සමගම දින කිහිපයක් ගෙවී ගියේය.වැස්ස අඩු දවසක් උදා වනතුරු නිපුන බලා සිටියේය .



<u>වැස්ස අඩු වීම</u>

එක සෙනසුරාදා දවසක වැස්ස අඩු විය.නිපුන උදෑසනම ක්‍රීඩා පිටියට ගියේය .ඔහු එහි යන විට අනිකුත් මිතුරන්ද පැමින සිටියේය.ඔවුහු බොහෝ වේලාවක් සෙල්ලම් කරමින් කාලය ගත කලහ.මෙලෙසම ඔවුන් සෙල්ලම් කිරීම සදහා දින කිහිපයක්ම ක්‍රීඩා පිටියට එකතු වූහ.



**<u>නිවාඩු කාලය අවසන් වීම</u>**

හෙට නිපුනට නැවතත් පාසල් යාමට ඇත .නිවාඩු කාලය අවසන් වූයේ ඔහුට නොදැනීමය.එදිනද මල් කුමරියන් වෙනදා මෙන්ම උදැසනින් ම පිබිදී තිබුණි.නැවුම් සුලඟ දසතින් හමා ආවේය.සුලඟට ගස් වල කොලද හැලී ඇත. ජනේල යෙන් එපිට බලා සිටි නිපුන් කඩිමුඩියේ පාසල් බෑගය සූදානම් කර ගත්තේ ය.

එදින දවස මුලුල්ලේම තම කාමරයට ම වී පාසල් ගෙන යාමට අවශ්‍ය දේවල් සූදානම් කල නිපුන හෙට දින ගැන සිතමින් නින්දට ගියේය .



**<u>පාසල් යෑම</u>**

හිමිදිරියේ ම අවදි වූ නිපුන සුපුරුදු ලෙස ඉක්මනින් සූදානම් වී පාසල් යෑම සඳහා පාසල් බස් රියට ගොඩ විය.අලුත් වාරයේ  දී ඉතා හොඳින් පාඩම් වැඩ වල නිරත විය යුතු යැයි නිපුන තරයේ සිතා ගත්තේය. පාසල අසලින් බැස ගත් නිපුන තම යහලුවන් ද සමග එකතු  වී සතුටු සිතින් පන්ති කාමරයට ගියේය .




SCHOOL

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හිස්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01